කැලණිය අධ්‍යාපන කලාපය

දෙවන වාර පරීක්ෂණය - 2017

8 ශ්‍රේණිය | කතෝලික ධර්මය | කාලය : පැය 2

නම : ..........................................................................................

## 1 පත්‍රය

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

01. ප්‍රඥාව නමැති ශුද්ධාත්ම දීමනාව මගින් හිමිවන වරප්‍රසාදය කුමක්ද?
1) හොඳින් ඉගෙන ගෙන විභාගයට පිළිතුරු ලිවීම සඳහා
2) මෙලොව වෙනුවට ස්වර්ගීය වස්තුව හා සැප සම්පත්වලට ඇලුම් කිරීම සඳහා
3) විශ්වාසයේ සත්‍යතා තේරුම් ගෙන දෙවිපියාණන්ට හිමි වන්දනාව කිරීම සඳහා
4) දේව මහිමය හා තම ගැලවීම සඳහා අවශ්‍ය දේ නිවැරදිව තේරුම් ගැනීම සඳහා

02. අභිවෘද්ධි ආලේපය නමැති දේව ප්‍රසාද නිධානය ලබාගැනීමට සම්පූර්ණ කළ යුතු වයස වන්නේ,
1) අවුරුදු 12 2) අවුරුදු 16 3) අවුරුදු 18 4) අවුරුදු 14

03. ශෙනෙලි විසින් දිව්‍ය සත්ප්‍රසාදයේ ලක්ෂණ නිවැරදිව ප්‍රකශ කළාය. එම නිවැරදි පිළිතුර කුමක්ද ?
(A) යාගයකි. (B) ගිවිසුමකි (C) සිහි කිරීමකි.
(D) භක්ති අභ්‍යාසයකි. (E) යාච්ඤාවකි.
1) A B D 2) B C E 3) A B C 4) A B E

04. "බිය නොවන්න. ඇදහිල්ලෙහිම සිටින්න. ඈ සුව වනු ඇත." කිතු සමිඳුන් මෙම ප්‍රකාශය කරනු ලැබුවේ,
1) ජායිරස්ගේ දුව උත්ථාන කළ අවස්ථාවේදීය. 2) දුෂ්ටාත්මයන් දුරුකළ අවස්ථාවේදීය.
3) කුදු ස්ත්‍රීය සුව කළ අවස්ථාවේදීය. 4) ලේ මාලේ රෝගියා සුවකළ අවස්ථාවේදීය.

05. (A) ධනපතියාගේ හා ලාසරස් උපමාව (B) යහපත් සමාරියා පිළිබඳ උපමාව
(C) වපුරන්නා පිළිබඳ උපමාව (D) මුතු ඇටයේ උපමාව
ශු. ලූක් තුමා පමණක් සඳහන් කරන උපමා කවරේ ද?
1) A C 2) B D 3) C D 4) A B

06. වැඩිහිටි ප්‍රසාද ස්නාපනයේ දී අභිවෘද්ධි ආලේපය දානය කරනු ලබන්නේ කවුරුන් ද?
1) වැඩිහිටි අයෙකි. 2) මීසමේ පියතුමා
3) රදගුරුතුමා 4) රාජගුරු ප්‍රසාදි තුමා

07. අපගේ ජීවිතවල ප්‍රාතිහාර්යය අත්දකීමට අප කුමක් කළ යුතුද?
1) පඬුරු ඔප්පු කළ යුතුයි. 2) ප්‍රසාද නිධාන ලබාගත යුතුයි.
3) නැකතට වැඩ කළ යුතුයි. 4) විශ්වාසයෙන් යාච්ඤා කළ යුතුයි.

08. ස්නාවක ජොහාන් තුමා නිර්භීතව ......................... වැරදි ක්‍රියා පෙන්වා දුන්නේය. හිස්තැන පුරවන්න.
1) පිලාත්ගේ 2) අන්නාස්ගේ 3) හෙරොද් ඇන්ටිපස්ගේ 4) කයිපාස්ගේ

09. සත්‍ය විශ්වාසයේ අප ස්ථිර කොට පූර්ණ ක්‍රිස්තු භක්තිකයන් බවට පත් කරන ප්‍රසාද නිධානය වන්නේ,
1) අභිවෘද්ධි ආලේපයයි. 2) පූජකවරයයි.
3) රෝගීන්ගේ ආලේපයයි. 4) ප්‍රසාද ස්නාපනයයි.

10. මාරුත දමනයේ ප්‍රාතිහාර්යය තුළින් ජේසු සමිඳුන් අපට ප්‍රකාශ වූයේ,
1) සොබාදහම ඔවුන් වහන්සේට කීකරුවන බවය.
2) මරණය පිට බලය ඔවුන්වහන්සේට හිමි බව
3) මුහුද නිශ්චල කිරීම ඔවුන්වහන්සේට හිමි බව
4) මැවිල්ලේ පූර්ණ අයිතිය ඇති බව

11. ජේසු සමිඳුන් නාසරෙත් නුවර ධර්ම ශාලාවේ දේශනා කරන ලද ග්‍රන්ථය කුමක් ද?
1) ජෙරමියා 2) එසකියෙල් 3) යෙසායා 4) දානියෙල්

12. ශු. ලූක් ශුභාරංචියට අනුව ජේසුස් වහන්සේ මුහුණ දුන් තුන්වන පරීක්‍ෂාව කුමක් ද?
1) ගල් ගෙඩිය පාන් කිරීමය. 2) දේව මාලිගාවේ කොත් මුදුනෙන් පනින්නට කීමය.
3) නමස්කාර කරන්නට යැයි පැවසීමය. 4) වතුර වයින් කිරීමය.

13. ස්නාවක ජොහාන් තුමා අයකැමියන්ට දුන් අවවාදය කුමක් ද?
1) මනස්ථාප වන්න. 2) කිසිවෙක් කිසිවක් පැහැර නොගන්න.
3) කෑම නැති අයට කෑම දෙන්න. 4) පමණට වැඩියෙන් බදු නොගන්න.

14. ස්නාවක ජොහාන් තුමාගේ මව්පියන් කවුරුන් ද?
1) සාන්ත ආනා හා සකරියස් තුමා 2) සෙකරියස් තුමා හා එළිසබෙත් තුමිය
3) මරියතුමිය හා ජොකිනු තුමා 4) හන්නා හා ජෝසප්

15. එම්මානුවෙල් යන්නෙහි අර්ථය කුමක් ද?
1) දෙවියන් වහන්සේ අප සමඟ ය. 2) ජේසුස් වහන්සේ අප සමඟ ය.
3) ශුද්ධාත්මයාණන් වහන්සේ අප සමඟ ය. 4) ශු. ත්‍රිත්වය අප සමඟ ය.

16. (A) තිමොති (B) ගලාති (C) ක්‍රියා පොත (D) එළිදරව්ව (E) ශු. ලූක්
ඉහත සඳහන් නව ගිවිසුමේ ග්‍රන්ථ අතුරින් ශු. ලූක්තුමා විසින් රචනා කර ඇති ග්‍රන්ථ මොනවාද?
1) A B 2) B C 3) C E 4) D B

17. යාච්ඤාව පිළිබඳ වැඩි අවධානය යොමු කරන සුභාරංචිය කුමක් ද?
1) ශු. ලූක් තුමා 2) ශු. මාක් තුමා 3) ශු. මතෙව් තුමා 4) ශු. ජොහාන් තුමා

18. ජේසුස් වහන්සේ තම ප්‍රසිද්ධ ජීවිතය ආරම්භ කළ ප්‍රදේශය වන්නේ,
1) ජෙරුසලම 2) ගලීලය 3) බෙත්ලෙහෙම 4) ජුදය

19. ආබ්‍රහම් තුමා හාරාන් දේශයෙන් පිටත් වී ................ දේශය බලා නික්ම ගියේ ය. හිස්තැන පුරවන්න.
1) හේබ්‍රොන් 2) නායින් 3) මිසරය 4) කානාන්

20. අප දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබාගත යුත්තේ,
1) නිසි සූදානමකින් යුතුවය. 2) බලය ලබාගැනීමට
3) සුවය ලබාගැනීමට 4) අන් අයට පෙනෙන පිණිස

# II පත්‍රය

- **පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.**

01) i) ශුද්ධාත්ම ඵල 4 ක් නම් කරන්න. (ල. 04)

ii) ශුද්ධාත්ම දීමනා 4 ක් නම් කරන්න. (ල. 04)

iii) අභිවෘද්ධි ආලේපන ප්‍රසාද නිධානයෙන් ලැබෙන දීමනා 4 ක් ලියන්න. (ල. 04)

iv) අභිවෘද්ධි ආලේපය ලැබූ අයගේ යුතුකම් 4 ක් ලියන්න. (ල. 04)

v) ආදර්ශමත් ජීවිතයක් ගත කිරීමට ශුද්ධාත්ම වරම් ඉල්ලා යාච්ඤාවක් ලියන්න. (ල. 02)

02) i) ජේසුස් වහන්සේ දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ස්ථාපිත කළ ශ්‍රී වචන ලියා දක්වන්න. (ල. 02)

ii) දිව්‍ය සත්ප්‍රසාද වහන්සේට පූර්ව සලකුණු 3 ක් දක්වන්න. (ල. 03)

iii) දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබාගත් ඔබ පාසල තුළ කරන යහපත් ක්‍රියා 5 ක් දක්වන්න. (ල. 05)

03) i) ප්‍රාතිහාර්යය යනු කුමක්දැයි කෙටියෙන් දක්වන්න. (ල. 01)

ii) ජේසුස් වහන්සේ සිදු කළ ප්‍රාතිහාර්යය වර්ග 4 සඳහන් කරන්න. (ල. 04)

iii) ඔබ ජේසුස් වහන්සේව අත්දුටු අවස්ථාවක් නම් කරන්න. (ල. 05)

04) i) දේව රාජ්‍යය යනු කුමක්දැයි කරුණු 2 ක් සඳහන් කරන්න. (ල. 02)

ii) වපුරන්නා පිළිබඳ උපමාවේ අඩංගු වන සරු බිමෙහි වැටුණු බීජ යන්නෙන් අදහස් කරන්නේ කුමක් ද? (ල. 03)

iii) දේව රාජ්‍යයේ ගුණාංග ඔබ තුළ වර්ධනය කර ගැනීමට කළ හැකි ක්‍රියා 5 ක් දක්වන්න. (ල. 05)

05) i) ජේසුස් වහන්සේගේ ළමා විය පිළිබඳ කරුණු 2 ක් සඳහන් කරන්න. (ල. 02)

ii) ස්නාවක ජොහාන් තුමා ජේසුස් වහන්සේගේ පෙරමග පිළියෙළ කෙළේ කෙසේද? (ල. 03)

iii) ඔබ සත්‍යයට සාක්ෂි දැරූ අවස්ථාවක් ලියා දක්වන්න. (ල. 05)

06) i) ශු. ලූක් තුමා පිළිබඳ කරුණු 2 ක් සඳහන් කරන්න. (ල. 02)

ii) ශු. ලූක් තුමා සඳහන් කරන ප්‍රශංසා ගීත 3 ක් නම් කරන්න. (ල. 03)

iii) ඔබ අසරණ වූවන් හට සරණ වූ අවස්ථාවන් 5 ක් සඳහන් කරන්න. (ල. 05)

07) මාතෘකා දෙකක් තෝරාගෙන කෙටි සටහන් ලියන්න.

i) කාන්තාවන්ගේ සුභාරංචිය

ii) අන්‍යජාතිකයන්ගේ සුභාරංචිය

iii) ශු. ජුසේවාස් මුනිතුමා

iv) අභියෝග ජයගනිමු.